දරිද්‍රතා සංක්ෂිප්ත





# ශ්‍රී ලංකාවේ නාගරික දරිද්‍රතාව - 2013

සංක්ෂිප්ත ප්‍රකාශන මාලාව
අංක 14 - 2014

cepa
centre for poverty analysis

# ශ්‍රී ලංකාවේ නාගරික දරිද්‍රතාව - 2013

ඉෂාරා රත්නායක

නෙරංජනා ගුණතිලක සහ අසර්‍රා අබ්දුල් කාදර් විසින් සම්පාදිත
"ශ්‍රී ලංකාවේ නාගරික දරිද්‍රතාව" සංක්ෂිප්තයේ ප්‍රතිශෝධනයකි

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (CEPA) ප්‍රකාශනයකි

සංක්ෂිප්ත ප්‍රකාශන මාලාව
අංක 14 - 2014

©දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2013

ISBN 978-955-1040-80-2

තේමාත්මක සංක්ෂිප්ත යනු දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ සංක්ෂිප්ත පත්‍රිකා මාලවේ කොටසකි. එහි අරමුණ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය විසින් තොරතුරු නිර්මාණය කරනු ලබන විෂයන්ට අදාළව කාලීනව හා ක්ෂණිකව තොරතුරු ඉදිරිපත් කිරීමයි.

සංක්ෂිප්ත පත්‍රිකා මාලාව ප්‍රවර්ග තුනකට අයත් ය.

1. **දරිද්‍රතා සංක්ෂිප්තඃ** නො නිල ස්වරූපයකින් හා තොරතුරු අන්තර්ගත වන ආකාරයෙන් රචනා කරනු ලබන මේවායේ අරමුණ වන්නේ විශේෂඥයන්ට මෙන් ම විශේෂඥ නො වන පාඨක පිරිසකට ද තොරතුරු සැපයීමයි.
2. **ප්‍රතිපත්ති සංක්ෂිප්තඃ** මෙම ප්‍රවර්ගය කෙළින් ම සංවර්ධනය හා දරිද්‍රතා අධ්‍යයනය හා සම්බන්ධ රජයේ, රාජ්‍ය නොවන, පර්යේෂක හා ආධාරක සංවිධාන ප්‍රතිපත්ති සම්පාදකයන් ඉලක්ක කර ගනියි.
3. **තේමාත්මක සංක්ෂිප්තඃ** විශේෂඥයන්ට මෙන් ම විශේෂඥ නොවන පාඨක පිරිසකට තොරතුරු සැපයීම අරමුණු කර ගත් මේවා විසින් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ තේමාත්මක කලාප පහේ ප්‍රශ්න ආවරණය කරයි. ඒවා තේමාත්මක කලාප පහට අයත් වන ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව හා අසමානතාව සමග ඍජුව සම්බන්ධ වන ප්‍රශ්න හදාරයි.

**රත්නායක,, ඉෂාරා**

ශ්‍රී ලංකාවේ නාගරික දරිද්‍රතාව - 2013 / ඉෂාරා රත්නායක, .- කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය , 2014

පිටු 19 ; සෙමී.22 .- (සංක්ෂිප්ත ප්‍රකාශන මාලාව ; 14)

ISBN 978-955-1040-80-2

i. 362.5095493 ඩිවි 23 ii. ග්‍රන්ථ නාමය

1. දරිද්‍රතාව-පර්යේෂන-විශ්ලේෂණ

2. නාගරික දරිද්‍රතාවය-ශ්‍රී ලංකාව

# පෙරවදන

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය පළමුව *ශ්‍රී ලංකාවේ නාගරික දරිද්‍රතාව* පළ කළේ 2004 දී ය. කොළඹ නගරයට විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකාවේ නාගරික දරිද්‍රතාව පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් ඉදිරිපත් කළ මෙම සංක්ෂිප්තය රචනා කරන ලද්දේ නෙරංජනා ගුණතිලක හා අස්රා අබ්දුල් කාදර් විසිනි.

2013 දී ඉෂාරා රත්නායක *ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහය - 2013* රචනා කළේ CEPA ආයතනයට සංක්ෂිප්තයේ වර්තමාන හා යාවත්කාලීන සංස්කරණයක අවශ්‍යතාව හැඟුණු බැවිනි.

මෙම සංක්ෂිප්තය ශ්‍රී ලංකාවේ නාගරික දරිද්‍රතාව සලකා බලන්නේ නාගරික දරිද්‍රතාව වඩාත්ම ව්‍යාප්ත කොළඹ අගනුවර ප්‍රදේශයට විශේෂ අවධානයක් යොමු කරමිනි. එය නාගරික දරිද්‍රතාවට විසඳුම් සෙවීමේදී ඊට දක්වන ප්‍රතිචාර හා මුහුණ දෙන අභියෝග විමසා බලයි. එසේ ම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා දරන ප්‍රයත්නයන්ට බලපාන තීරණාත්මක ආයතනික හා ප්‍රතිපත්තිමය කාරණා ඉස්මතු කර දක්වයි.

සැපයූ යෙදවුම් පිළිබඳව CEPA ආයතනික දරිද්‍රතා තක්සේරු හා මිනුම් වැඩ සටහනේ රොමේෂන් කුලසබානාදන්ට හා ගීතා මායාදුන්නේට ඉෂාරා සිය කෘතඥතාව පළ කරයි. සැපයූ සහාය වෙනුවෙන් සෙවනත ආයතනයේ එච්. එම්. යූ. චූලරත්න මහතාට හා කොළඹ මහ නගර සභාවේ තමාරා මල්ලවාරච්චි මෙනෙවියට ද ඇය ස්තුතිවන්ත වෙයි.

CEPA ආයතනය මෙම සංක්ෂිප්තය මුද්‍රණය කිරීම පිළිබඳව සහ සිංහල හා දෙමළ පරිවර්තන සඳහා අරමුදල් සැපයීම පිළිබඳව තින්ක් ටැන්ක් ඉනීෂියේටිව් (TTI) ආයතනයට කෘතඥතාව පළ කරයි.

මෙම සංක්ෂිප්තය තුළ ප්‍රකාශිත අදහස් හා මත කතුවරියගේ වන අතර දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ අදහස් හා මත පිළිබිඹු නොකරයි.

# පටුන


1. හැඳින්වීම 1

2. නාගරික දරිද්‍රතාවේ පසුබිම 1

    2.1 ශ්‍රී ලංකාවේ නාගරික අංශය 1

    2.2 නාගරික අංශයේ දරිද්‍රතාව 2

    2.3 කොළඹ නගරයේ දරිද්‍රතාව 3

    2.4 කොළඹ නාගරික දරිද්‍රතාවේ පැතිකඩවල් සහ ඒවාට තුඩු දෙන බලවේග 4

    2.5 සාපේක්ෂ හා පරම අවකාශය 4

3. කොළඹ නාගරික දරිද්‍රතාවට ප්‍රතිචාර දැක්වීම 6

4. නාගරික දරිද්‍රතාවට විසඳුම් සෙවීමේ දී මුහුණ දෙන අභියෝග 11

    4.1 ආයතනිකතත්වය 12

    4.2 ප්‍රතිපත්තිමය රාමුව 14

    4.3 නාගරික දරිද්‍රතාව පිළිබඳ දැනුම් පදනම පුළුල් කිරීම දෙසට යොමු වීම 15

5. ක්ෂණිකව මැදිහත් විය හැකි ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනීම 15

විමර්ශන/වැඩි දුර කියවීම් 18

## 1. හැඳින්වීම

මෙම දරිද්‍රතා සාරාංශය නාගරික දරිද්‍රතාව වඩාත් ම පැතිර පවතින කොළඹ නාගරික ප්‍රදේශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නාගරික දරිද්‍රතාවේ තත්වය පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් ඉදිරිපත් කරයි. එය කොළඹ නාගරික ප්‍රදේශයේ දරිද්‍රතාවේ පසුබිම, නාගරික දරිද්‍රතාවට විසඳුම් සෙවීමේ දී ඊට දක්වන ප්‍රතිචාර හා මුහුණ දෙන අභියෝග විමසා බලන අතර ගැටලුවට විසඳුම් සෙවීම සඳහා දරන ප්‍රයත්නයන්ට බලපාන තීරණාත්මක ආයතනික හා ප්‍රතිපත්තිමය කාරණා ඉස්මතු කර දක්වයි. අවසානයේ එය ක්ෂණිකව මැදිහත් විය හැකි ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගනියි.

නිදහස ලද තැන් සිට ම ග්‍රාමීය හා වතු අංශවල දරිද්‍රතාව පවතින බව පිළිගෙන ඒ ගැන පුළුල් ලෙස සාකච්ඡා කර ඇතත්, දැනුවත්කම මඳකම නිසා නාගරික අංශයේ දරිද්‍රතාව සංසන්දනාත්මකව නො සලකා හැර ඇත. මේ අනුව දැනුම් පදනම මෙන් ම ප්‍රතිපත්ති සැකසීම හා මැදිහත් වීම් ද ග්‍රාමීය හා වතු අංශයට බෙහෙවින් නැඹුරු විය. කෙසේ වුව ද නාගරික දරිද්‍රතාවේ සුවිශේෂතා ක්‍රමයෙන් පිළිගැනීම හා නාගරික අවධානයක් සහිතව ආයතන පිහිටුවීමත් සමග පසු ගිය දශක තුනේ දී එය යම් තරමක ප්‍රමුඛත්වයක් අත් කර ගෙන ඇත. මේ නිසා නාගරික දරිද්‍රතා ගැටලුවලට විසඳුම් සෙවීම ප්‍රතිපත්තිමය හා වැඩ සටහන්මය මැදිහත් වීම්වල දී වඩ වඩා පෙරමුණට විත් ඇත.

## 2 නාගරික දරිද්‍රතාවේ පසුබිම

### 2.1 ශ්‍රී ලංකාවේ නාගරික අංශය

බොහෝ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සමග සහ විශේෂයෙන් ම දකුණු ආසියාවේ ආර්ථිකයන් සමග සසඳන විට ශ්‍රී ලංකාවෙන් වාර්තා වන්නේ පහළ මට්ටමේ නාගරීකරණයකි. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ (DCS) 2001 සංඛ්‍යා ලේඛන අනුව කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ නිවැසි ජනගහනය 647,100ක් වූ අතර 2000 දී ශ්‍රී ලංකාවේ මුළු නාගරික ජනගහනය මිලියන 2.97ක් යැයි තක්සේරු කොට තිබිණ. 2010 දී මෙම සංඛ්‍යාව මිලියන 2.92 දක්වා පහත වැටී නාගරික ජනගහනය ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 14%ක් බවට පත් විය (http://www.indexmundi.com/sri_lanka).

ඉහත තක්සේරු පදනම් වන්නේ 'නාගරික අංශය' යනු මහ නගර සභාවකින් හෝ නගර සභාවකින් පාලනය වන ප්‍රදේශයන් ය යන වර්තමාන නිර්වචනය මත ය. කෙසේ වුව ද කොළඹ නගරය වටා සිදුව ඇති උපනාගරික පැතිරීම පුළුල් වෙමින් පවතින තත්වය තුළ මෙම නිර්වචනයේ අදාළත්වය ගැන සැක මතු වෙයි. ඊට හේතුව එය පදනම් වන්නේ ගොඩ නගන ලද පරිසරය හා සමාජ-ආර්ථික ව්‍යුහයන්

පදනම් කර ගත් නිර්ණායක මත නොව පරිපාලනමය සීමා මායිම්[1] මත වීම යි. 1980 ගණන් මුල දී කොළඹ ඇතුළු ප්‍රධාන නගරවල නාගරික වර්ධන අනුපාතිකය 1%ට පහළ මට්ටමක පැවතිණ. එහෙත් 1980 ගණන් මැද සිට කොළඹ වටා පිහිටි පුළුල් නගරාසන්න ප්‍රදේශය වේගයෙන් වර්ධනය විය. 1981 හා 1992 අතරතුර දිස්ත්‍රික්කයේ ජනගහන වර්ධනය 20%ක් වූ අතර නාගරික ජනගහනය 60% ඉක්ම ගියේ ය. ජනගහන වර්ධන අනුපාතිකය 15%ට පහළ මට්ටම්වල පැවති අනෙක් දිස්ත්‍රික්ක සමග සැසඳූ විට මෙය සැලකිය යුතු ඉහළ යාමක් විය.

## 2.2 නාගරික අංශයේ දරිද්‍රතාව

ජාතික දෘෂ්ටි කෝණයකින් නාගරික දරිද්‍රතාව විමසා බැලීමෙන් සම්පාදනය වන්නේ ඉතා සතුටුදායක චිත්‍රයකි. ශ්‍රී ලංකාව තුළ පහළ ම දරිද්‍රතා අනුපාතික තිබෙන්නේ නාගරික අංශයෙහි ය. දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින්නේ ජනගහනයෙන් 5.3% ක් පමණකි (ආසන්න වශයෙන් මිලියන 1කි). ජාතික අනුපාතිකය වන 8.9% සමග සැසඳූ විට මෙය සැලකිය යුතු පහළ අගයක් වේ.[2]

දරිද්‍රතාව පිළිබඳ සාම්ප්‍රදායික ජාතික නිර්වචන අනුව තීරණාත්මක විචල්‍යයන් ලෙස සැලකෙන්නේ ආහාර හා ආහාරමය නොවන ද්‍රව්‍ය සඳහා කෙරෙන වියදම් ය. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව පවසන පරිදි (2004) ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව ප්‍රකාශයට පත් වන්නේ කැලරි පරිභෝජනය අනුව වන අතර නිර්වචනය වන්නේ පුද්ගලයෙකුගේ ඒකපුද්ගල වියදම කිලෝකැලරි 2030 ක පෝෂණ සුරක්ෂිතතාව සැපිරිය යුතු ය යන පදනම මත ය. පවත්නා මෑත කාලීන ම දත්ත අනුව[3] නාගරික කුටුම්බයක් ආහාර හා පාන සඳහා මසකට වැය කරන මුදල රු. 16,003 ක්[4] හෙවත් මුළු වියදමෙන් 36%ක් වන අතර මීට අදාළ ජාතික සාමාන්‍යය 42%කි. කෙසේ වුව ද අනෙක් දිස්ත්‍රික්ක සමග සසඳන විට නාගරික දුප්පතුන්ගේ හා පොදුවේ කොළඹ දිස්ත්‍රික්කයේ භෝජන ශක්ති පරිභෝජනය පවතින්නේ පහළ මට්ටමක ය (DCS, 2011). නාගරික අංශයේ ආදායම් අසමානතාව 0.48 ක් වන අතර එය පවතින්නේ ජාතික සාමාන්‍යය වන 0.49 ට පහළ මට්ටමක ය. මෙම සංඛ්‍යාව පෙන්නුම් කරන්නේ නාගරික කුටුම්බ අතර ආදායම් අසමානතාව සංසන්දනාත්මකව පහළ මට්ටමක පවතින බව යි. මෙම සංඛ්‍යා පෙන්නුම් කරන්නේ දරිද්‍රතාව හා

---

1 ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව නාගරික අංශය නිර්වචනය කරන්නේ 'මහ නගර සභාවකින් හෝ නගර සභාවකින් පාලනය වන ප්‍රදේශ' යනුවෙනි. වතු අංශය 'අක්කර 20කට වැඩියෙන් තිබෙන්නා වූත් තනි පරිපාලන ඒකකයක් තුළ නේවාසික ශ්‍රමිකයන් 10 දෙනෙකුට වැඩියෙන් සිටින්නා වූත් වතු ප්‍රදේශ' යනුවෙනුත්, ග්‍රාමීය අංශය 'නාගරික හෝ වතු අංශයට අයත් නොවන නේවාසික ප්‍රදේශ' යනුවෙනුත් නිර්වචනය කර ඇත.

2 *Household Income and Expenditure Survey – 2009/10, Final Report, Department of Census and Statistics, Sri Lanka.*

3 *Household Income and Expenditure Survey – 2009/10, Final Report, Department of Census and Statistics, Sri Lanka.*

4 මෙම සංඛ්‍යාව සියලු නාගරික කුටුම්බවලට අදාළ වන අතර ආදායම් කාණ්ඩ අනුව වෙන් කොට දැක්වීමක් නො කෙරේ.

අසමානතාව අතින් නාගරික අංශය ජාතික සාමාන්‍යයන් සමග සසඳන විට යහපත් මට්ටමක පවතින බව යි.

## 2.3 කොළඹ නගරයේ දරිද්‍රතාව

කෙසේ වුවද ග්‍රාමීය හා වතු අංශ සමග සසඳන විට නාගරික අංශයේ අහිමි වීම් සංසන්දනාත්මකව පහළ මට්ටමක පවතින බව පිළිගත හැකි නමුත් ආහාර සඳහා කරන වියදමේ නාගරික සාමාන්‍යය ඉහළ අගයක් ගැනීම පිළිබිඹු කරන්නේ නාගරික අංශය වාණිජකරණය වීම හෙවත් ජීවනෝපායේ සෑම පැතිකඩකදීම මූලික විචල්‍යය මුදල බවට පත් වීම බව අවධාරණය කළ යුතු ය. මෙම සංඛ්‍යා සලකා බැලිය යුත්තේ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි නිරතුරුව දැකිය හැකි පරිදි කොළඹ නාගරික දරිද්‍රතාව ද සමන්විත වන්නේ ජාතික දරිද්‍රතා රේඛාවෙන් ඉහළ ආදායම් ලබන (දුප්පතුන් ලෙස වර්ග නොකෙරෙන) කුටුම්බ වලින් නමුත් ඔවුන් ජීවත් වන්නේ ගුණාත්මක අතින් ඉතා දුර්වල නිවාසවල සහ යටිතල පහසුකම් හා මූලික සේවාවන් වෙත ප්‍රවේශය දැඩි ලෙස හිඟ, ජනයා පිරීතිරී ගිය, සනීපාරක්ෂාව නැති හා අනාරක්ෂිත තත්වයන් තුළය යන කරුණ පදනම් කොට ගෙනය. මේ නිසා නාගරික දරිද්‍රතාව සම්බන්ධයෙන් අවධාරණය කළ යුතු සැලකිය යුතු කරුණක් වන්නේ අහිමි වීමට බලපාන ප්‍රධාන හේතුව පහළ ආදායම වුවත් සැලකිය යුතු ආදායම් ලබන කුටුම්බ වලට පවා මූලික සේවාවන් වෙත ප්‍රවේශය සහ සනීපාරක්ෂක හා සුරක්ෂිත ජීවන පරිසරයක් නොමැති විය හැකි ය යන්න යි.

කොළඹ නාගරික දුප්පතුන්ගෙන් බොහෝ දෙනෙකු ජීවත් වන්නේ ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස (USS) ලෙස හැඳින්වෙන මුඩුක්කු හා පැල්පත්වල ය. කොළඹ මහ නගර සභා සීමාව තුළ වර්තමානයේ අඩු ආදායම්ලාභී[5] ජනාවාස 1,735ක් තිබෙන අතර කොළඹ ජනගහනයෙන් ආසන්න වශයෙන් 50%ක් පමණ ජීවත් වන්නේ එම ජනාවාසවල ය (Sevanatha, 2012). ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස වලට අයත් වන්නේ කොළඹ නගරය තුළ පිහිටියා වූත් බොහෝ විට නිවැසියන්ට අයත් නැති රාජ්‍ය හෝ පෞද්ගලික ඉඩමක ඉදි කළා වූත් නිවාස ඒකක ඒකරාශි වූ ප්‍රදේශයන් ය. ඉතා ඉහළ ජනගහන ඝනත්වයක් (ආසන්න වශයෙන් හෙක්ටයාරයකට පුද්ගලයන් 820ක්[6] හෙවත් කොළඹ නගරයේ සාමාන්‍යය මෙන් හතර ගුණයකි) සහ තදබද වූ නිවාස (ඉඩම් කට්ටියක සාමාන්‍ය විශාලත්වය පර්චස් 1.5කි) පැවතීම මෙම නිවාස ප්‍රදේශ වල පොදු ලක්ෂණයක්

---

5 ජනාවාසවලින් 1,626ක් වැඩි දියුණු කළ හා පූර්ණ ලෙස වැඩි දියුණු කළ ඒවා ලෙස වර්ග කර ඇත. මෙය පෙන්නුම් කරන්නේ මෙම ජනාවාසවල කුටුම්බ සිය ආර්ථික තත්වය හා ඒ අනුව ජලය හා විදුලි බලය වැනි මූලික සේවාවන් වෙත ප්‍රවේශය සලසා ගෙන සිය නිවාසවල භෞතික තත්වය වැඩි දියුණු කර ගැනීමට සමත් වී ඇති බව යි.

6 ගණනය කර ඇත්තේ 2001 ජන සංගණනය සහ ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල ඉඩම්වල වර්ග ප්‍රමාණය හා සංසන්දනාත්මකව එම ජනාවාසවල ජීවත් වන කොළඹ ජනගහනයේ ප්‍රමාණය පිළිබඳව පවත්නා දත්ත පදනම් කර ගෙන ය.

වන නමුත් ඒවා මුඩුක්කු හෝ පැල්පත් ලෙස හැඳින්වෙන්නේ නිවැසියන් සඳහා පවත්නා සේවාවන් හා යටිතල පහසුකම් අතිදුර්වල තත්වයක තිබෙන බැවිනි.

## 2.4 කොළඹ නාගරික දරිද්‍රතාවේ පැතිකඩවල් සහ ඒවාට තුඩු දෙන බලවේග

නාගරික දරිද්‍රතාවේ ස්වභාවය නොවෙනස්ව පැවතීම සහ වෙනස් වීමට තුඩු දෙන බලවේග අතර පවත්නා අන්තර් සම්බන්ධතා පිළිබඳ ගැටලුව යනු දරිද්‍රතා ගැටලුවලට විසඳුම් සෙවීමට කටයුතු කරන්නන් උනන්දු කරවන කරුණු ය. ප්‍රජා හා කුටුම්බ මට්ටමේ දී දරිද්‍රතාවට බලපාන ප්‍රධාන සාධක පහත දැක්වෙන පරිදි සාරාංශ කළ හැකි ය[7].

ජීවනෝපාය රටාවන් ගත් විට විදේශ රැකියා, ස්වයං රැකියා හා ව්‍යවසායන්, නොවිධිමත් අංශයේ ක්‍රියාකාරකම් සහ වරාය, කර්මාන්ත, දුම්රිය, නාගරික වෙළඳ පොළවල්, මහ නගර සභාව යනාදී ආයතනවල පහළ මට්ටමේ විධිමත් අංශයේ රැකියා යනු වඩා ඉහළ පැවැත්මක් සහිත ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය ස්වරූපයන් වන අතර දුප්පත් කුටුම්බ අතර වඩාත් ම පොදුවේ දැකිය හැකි ජීවනෝපාය ස්වරූපය වන්නේ අර්ධ නිපුණ වැටුප් ශ්‍රමය යි.

වඩා ඉහළ පැවැත්මක් සහිත කුටුම්බවල දැකිය හැකි පැහැදිලි ලක්ෂණයක් නම් කුටුම්බ ආදායම ප්‍රමාණවත් වීම නිසා කාන්තාවන් නිවසේ රැඳී සිටීමට තීරණය කිරීම යි. එහෙත් දුප්පත් කුටුම්බවල කාන්තාවෝ ගෘහ සේවය හා ඉදි කිරීම් අඩවිවල ඇති නුපුහුණු අතින් කරන කටයුතු වැනි වැඩි ශ්‍රම සූක්ෂ්මතාවක් සහිත ජීවනෝපාය ස්වරූපයන්හි නිරත වෙති.

## 2.5 සාපේක්ෂ හා පරම අවකාශය

ජනාවාසය පිහිටි ස්ථානයට සංසන්දනාත්මකව ජනාවාසයේ වටපිටාව සහ ජනාවාසය හා කුටුම්බය තුළ ඇති අවකාශය යනු ප්‍රජාවේ හා කුටුම්බවල පැවැත්ම පිළිබඳ නිර්ණායක වේ. පැවැත්මේ මට්ටම නොතකා නිවැසියන්ට සෞඛ්‍යය, අධ්‍යාපනය හා ප්‍රවාහනය වැනි සේවාවන් හා පහසුකම් ගණනාවක් වෙත මනා ප්‍රවේශයක් සැලසෙන බැවින් සහ වැටුප් ශ්‍රමය සහ ස්වයං රැකියා හා ව්‍යවසායන් සඳහා පහසුකම් සපයන වෙනත් රැකියා මූලාශ්‍රවලට යහපත් ප්‍රවේශයක් සැලසෙන බැවින් ජනාවාස කේන්ද්‍රගතව පිහිටීම ප්‍රමුඛ ධනාත්මක ලක්ෂණයකි. මීට සංසන්දනාත්මකව නිවාස ඒකකවල විශාලත්වයෙන් හා පොදු අවකාශ නොමැතිකමින් පිළිබිඹු වන ජනාවාස අවකාශයේ දැඩි සීමිත බව සැලකෙන්නේ ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල දක්නට ලැබෙන තීරණාත්මක ඍණාත්මක ලක්ෂණයක් ලෙස ය. අවකාශය ප්‍රමාණවත් නොවීම ප්‍රජා මට්ටමේ දී විනෝදායන

[7] මෙම කොටස පදනම් වන්නේ Understanding the Dimensions and Dynamics of Poverty in Underserved Settlements in Colombo, a study conducted by CEPA for CMC/PRIMUSS මත ය.

ක්‍රියාකාරකම් හා එහා මෙහා යාම සීමා වීමට හා ලෙඩ රෝග පැතිරීම වැඩි වීමටත් කුටුම්බ මට්ටමේ දී සමාජීය උත්සව අවස්ථාවලට (උදා. අවමගුල් උත්සව, මංගල උත්සව) හා නිවස පදනම් කර ගත් ආදායම් උත්පාදනයට අවකාශය මඳ වීමට හා පෞද්ගලිකත්වය සීමා වීමටත් හේතු වේ. මෙවැනි තත්වයන්ගෙන් මිදීමට නිවැසියන් බොහෝ විට කරන්නේ තදබද බව අඩු ප්‍රදේශ කරා සංක්‍රමණය වීම වුවත් මෙම හැකියාවට ධනය බලපායි. එපමණක් නො ව ජනාවාස හඳුන්වන නම්වලට ඇඳී ඇති අපකීර්තිය හා වෙනස්කම් කිරීම වැඩිහිටියන් සහ විශේෂයෙන් ම ළමයින් යන දෙපාර්ශ්වයට ම සැලකිය යුතු ගැටලුවකි. මෙම ජනාවාසවල ජීවත් වන ජනතාවට ඇඳී ඇති අපකීර්තිය නිසා ගුණාත්මක අතින් උසස් පාසල්වලට ඇතුළත් වීමේ දී ද බාධා ඇති වේ (Gunetilleke and Abdul Cader, 2004).

ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස ලෙස අර්ථ නිරූපණය වීමට තුඩු දෙන විචල්‍යය වන්නේ සේවාවන් හා යටිතල පහසුකම් පැවතීමේ දුර්වලතාව යි. දරිද්‍රතාවේ හරය සකස් වන්නේ ආර්ථික පැතිකඩවල් මගින් වුවත් සේවාවන් හා යටිතල පහසුකම් වෙත පවතින ප්‍රවේශය හැම විට ම කුටුම්බ ආදායම් මට්ටම්වලට අනුරූප නො වේ. සුවිශේෂ සේවාවන් ලැබීම සම්බන්ධයෙන් ගත් කල ගෘහ ජල මූලාශ්‍ර පැවතීම, ඉවත දමන හා මතුපිට ජල අපවහනය, වැසිකිළි, විදුලි බලය හා මාර්ග යනු නිවැසියන්ට හිඟ නමුත් ඔවුන්ගේ අවශ්‍යතාවන් ලෙස හඳුනා ගත හැකි සේවාවන් ය. වඩා දුප්පත් ජනාවාස තුළ දී රාජ්‍ය සේවාවන් මත රඳා පැවතීම බොහෝ විට වඩා ඉහළ මට්ටමකින් දැකිය හැකි අතර දැඩි ලෙස හිඟ වූ විට නුසුදුසු සහ බොහෝ විට නීති විරෝධී වැසිකිළි ඉදි කිරීමට තුඩු දෙයි. මෙය නළ මාර්ග හිර වීම හා මලාපවහන නළ පිටාර ගැලීම, මලාපවහන පද්ධති ඇළ මාර්ගවලට හැරවීම යන ආශ්‍රිත ගැටලු නිර්මාණය කර විශේෂයෙන් ම ළමයින්ට සෞඛ්‍යාශ්‍රිත ගැටලු ඇති කරයි. මෙම ජනවාසවලින් බොහොමයක් පිහිටා තිබෙන්නේ ගංවතුරට ගොදුරු විය හැකි ගොහොරු බිම් හා ඇළ රක්ෂිත වැනි මායිම් ඉඩම්වල නිසා අපවහන ගැටලු පෙරමුණට එයි. ජනාවාස වෙත වැටී ඇති මාර්ගවල හා ජනාවාස තුළ ඇති පටු මාවත්වල තත්ත්වය බොහෝ විට දුර්වල බැවින් ජනාවාසය වෙත ප්‍රවේශයට සහ ජනාවාසය තුළ ප්‍රවේශයට බාධා ඇති වේ.

ජනාවාස තුළ පවතින දුර්වල සෞඛ්‍ය තත්ත්වයට හේතු වන්නේ, ඒවා ජලය එක තැන පල් වන ඇළ මාර්ගවලට, බරවා රෝගය වැනි රෝගවලට හේතු වන මදුරුවන් බෝ වන බිම්වලට සමීපාසන්නව පිහිටා තිබීම යි. එපමණක් නො ව තදබදව පිහිටීම, ඉහළ ජනගහන ඝනත්වය හා නිවාස ව්‍යුහයන් සමීපාසන්නව පිහිටීම රෝග පැතිරීමට පහසුකම් සපයා එය වේගවත් කරන්නේ ද වේ.

මත්ද්‍රව්‍ය හා මත්පැන් අපයෝජනය නාගරික දුප්පතුන්ගේ ත ත්ත්වය වඩාත් නරක අතට හරවන සාධකයක් ලෙස සැලකිය හැකි ය. බොහෝ විට පුද්ගලයන්ගේ හා කුටුම්බවල පහළ මට්ටමේ පැවැත්මට ප්‍රධාන හේතුව ලෙස සැලකෙන්නේ මත්ද්‍රව්‍යවලට හා මැත්පැන්වලට ඇබ්බැහි වීම යි. මීට අමතරව ඔවුන් විවාහයේ

අස්ථාවරත්වයට, අපරාධවලට හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමට වැඩි ඉඩක් ඇත. 2012 දී ලෝක බැංකුව වෙනුවෙන් කොළඹ අඩු ආදායම්ලාභී ජනාවාසවල සිදු කළ ජීවනෝපාය තක්සේරුවක දී (UNHABITAT et al., 2012) අනාවරණය වූයේ පවුලේ සාමාජිකයන් මත්පැන් භාවිත කිරීම කුටුම්බය තුළ අනාරක්ෂිත භාවයට හේතුවක් වන බව යි. මත්ද්‍රව්‍ය හා මත්පැන් භාවිතය නිවසින් බාහිර භීතියට ද හේතු වන බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

නිවාස හා ඉඩම් අයිතිවාසිකම් නාගරික දරිද්‍රතාවේ වැදගත් අංග වෙයි. නිවාස තත්ත්වයේ වැඩි දියුණුව හා ජීවන අවකාශය පුළුල් වීම වසර ගණනාවක් තිස්සේ ම ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල නිවැසියන්ගේ පැවැත්ම වැඩි දියුණු කරන ප්‍රමුඛ සන්ධිස්ථානයක් වී ඇති බව සැලකිය හැකි ය. මෙය වත්කම් පදනම පුළුල් කොට භුක්තිය සුරක්ෂිත කර ජීවන තත්ත්වයන් වැඩි දියුණුකරන අතර සමාජ තත්ත්වය වැඩි දියුණු කර ගෞරවය හා අභිමානය ගෙන දෙයි. එමෙන් ම එමගින් විදුලි බලය වැනි සේවාවන් අත්පත් කර ගැනීමට නිවැසියන්ට ඇති හැකියාව වැඩි වී ඇති අතර කාමර කුලියට දීමෙන් හෝ නිවස පදනම් කර ගත් ක්‍රියාකාරකම්වලින් ආදායම් උත්පාදනය කර ගැනීමේ අවස්ථා සම්පාදනය වේ.

ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස තුළ ප්‍රජා මූල සංවිධාන (CBOs) ගණනාවක් ම ක්‍රියාත්මක වන නමුත් එම සංවිධාන විසින් කරන ක්‍රියාකාරකම්වල සාමාන්‍ය මට්ටම බොහෝ ප්‍රජාවන් තුළ දී පවතින්නේ පහළ මට්ටමක ය. ප්‍රජා මූල සංවිධානවලින් නිවැසියන්ගේ අදහස් ප්‍රකාශයට පත් කිරීමේ හා බලාධිකාරීන් වෙත පැමිණිලි කිරීමේ ඍජු ක්‍රමයක් සම්පාදනය වෙතත් මෙම ජනාවාස තුළ වෙසෙන්නන්ගේ පැවැත්ම වැඩි දියුණු කිරීමේ දී නොවිධිමත් හා විධිමත් ජාල ඊට වඩා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බව සැලකිය හැකි ය. (අඛණ්ඩව සිදු වන සංක්‍රමණය නැවතී) ජනාවාස ජනගහනයන් ස්ථාවර වීම හා එක් ස්ථානයක දිගු කලක් වාසය කිරීම මෙම ජාල සංවර්ධනය කිරීමට හා තිරසර කිරීමට පහසුකම් සපයන සාධක ලෙස සැලකිය හැකි ය.

## 3. කොළඹ නාගරික දරිද්‍රතාවට ප්‍රතිචාර දැක්වීම

මෙම සාරාංශය තුළ කලින් ඉස්මතු කර දැක්වූ වාර්තාගත නාගරීකරණයේ මන්දගාමී වේගයෙන් සහ ග්‍රාමීය ජනගහනය මුහුණ දෙන දැවෙන ගැටලුවලින් අදහස් වන්නේ 1970 ගණන් වන තෙක් නාගරික දරිද්‍රතාව, රාජ්‍ය මැදිහත්වීම්වල දී විශේෂඥ ප්‍රමුඛතා ක්ෂේත්‍රයක් ලෙස නොසැලකූ බව යි. නාගරීකරණයේ මන්දගාමී වේගය සහ නගරය තුළ මුඩුක්කු හා පැල්පත් ජනාවාස අඩු සංඛ්‍යාවක් පිහිටා තිබීම ද නාගරික දුප්පතුන්ගේ ජීවනෝපායන් පිළිබඳ රජයේ මැදිහත් වීම් අඩු වීමට හේතුවිය. 1970 ගණන් හා 1980 ගණන්වල දී වැඩෙන නාගරික දරිද්‍රතා ගැටලු ක්‍රමයෙන් හඳුනා ගැනුණු විට රජය අතිප්‍රධාන වශයෙන් ප්‍රතිචාර දැක්වූයේ නිවාස සංවර්ධන ක්ෂේත්‍රයේ දී ය. මෙයට ප්‍රතිපත්ති හා නියාමන වෙනස්කම් (උදා. 1973

නිවාස දේපළ නීතිය සීමා කිරීම) සහ රජය අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදි කළ අවස්ථාවල දී සෘජු මැදිහත් වීම් සඳහා රාජ්‍ය ආයතන පිහිටුවීම (උදා. නිවාස සංවර්ධන අධිකාරිය, පොදු පහසුකම් මණ්ඩලය යනාදිය) ඇතුළත් විය. මීට අමතරව කොළඹ මහ නගර සභාවේ (CMC) මහජන ආධාර දෙපාර්තමේන්තුව විසින් පහළ ම ආදායම්ලාභී කුටුම්බවලට මුදල් දීමනා පිරිනැමීමේ යෝජනා ක්‍රම ද පැවතිණ. කොළඹ මහ නගර සභාවේ මහජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ද නගරය තුළ මුඩුක්කුවාසීන්ගේ ජීවිත වැඩි දියුණු කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කළේ ය. කෙසේ වුව ද 1990 ගණන් මැද වන විට නාගරික දරිද්‍රතාව නිවාස සැපයීම, සේවා සම්පාදනය, සෞඛ්‍යය, අධ්‍යාපනය හා නිපුණතා සංවර්ධනය සහ ප්‍රජා සංවර්ධනය ඇතුළත් සාකල්‍ය ප්‍රවිෂ්ටයක් අවශ්‍ය කරන විශේෂ ගැටලුවක් ලෙස පිළිගැනීමට ලක්ව තිබිණ. ගැටලුව පිළිබඳ දැනුවත්කම වැඩි වීමත් සමග මෙම ගැටලුවලට විසඳුම් සෙවීමේ අවශ්‍යතාව ද ඇති විය. 2000 මහ නගර සභා සැලැස්ම වැනි නගර මට්ටමේ සාර්ව සැලසුම් නාගරික දරිද්‍රතාව පිළිබඳ ගැටලුවට සුවිශේෂ අවධානයක් යොමු නොකළේ ය. සැලැස්ම වූයේ කර්මාන්ත හා ගුදම් නගරයෙන් ඉවත්කොට හඳුනා ගත් නව ස්ථානවලට රැගෙන යාම සහ යාබද මහ නගර සභාව වූ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පරිපාලනමය අගනුවර ලෙස සංවර්ධනය කිරීම යි. අහිමි වීමේ විවිධ පැතිකඩවල් ඉලක්ක කර ගත් 'වැඩ සටහන්' හා 'ව්‍යාපෘති' ගණනාවක් අරමුදල් සපයන්නන්, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූල සංවිධාන හා ඇතැම් අවස්ථාවල දී සාම්ප්‍රදායික පෞද්ගලික අංශය වැනි රාජ්‍ය නොවන ක්‍රියාකාරයන් සමග එක්ව විවිධ රාජ්‍ය ආයතන විසින් මෙහෙයවන ලදී (Gunetilleke and  Abdul Cader, 2004).

නාගරික දරිද්‍රතාව දෙසට තීරණාත්මක ලෙස නැඹුරු වීම සිදු වූයේ ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස මුහුණ දෙන අහිමි වීම පිළිබඳ නානාවිධ සංකීර්ණ ගැටලුවලට එම ජනතාව නගරයේ නීතිමය හා නියාමනීය අවශ්‍යතාවන්ට අනුකූල නොවීම නො තකා විසඳුම් සෙවිය යුතු බව පිළිගැනීමත් සමග ය. නගරය තුළ පිහිටි නීති විරෝධී ඉදි කිරීම් ය යන පදනම මත කලින් ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස කෙරෙහි සුළු වශයෙන් අවධානය යොමු කළ කොළඹ මහ නගර සභාව වැනි රාජ්‍ය ආයතනවලට මෙය වැදගත් පියවරක් විය. කොළඹ අඩු ආදායම්ලාභී පුරවැසියන් නිදහසේ ප්‍රවේශ වූ සේවාවන් (උදා. නිවාරණ හා ප්‍රතිකාර සෞඛ්‍ය රැකවරණය, මහජන විනෝදායන පහසුකම්, වෘත්තීය පුහුණුව) සම්පාදනය කිරීමේ දීර්ඝ ඉතිහාසයක් කොළඹ මහ නගර සභාවට තිබුණත් ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස හෝ එම ජනාවාස මුහුණ දෙන සුවිශේෂ ගැටලු එම සේවාවන්ගේ ඉලක්ක බවට පත්ව නො තිබිණ (Gunetilleke and Abdul Cader, 2004).

ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස පිළිබඳ කොළඹ මහ නගර සභා ප්‍රතිපත්තියෙහි සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි වැඩ සටහනක් නම් නීතිමය බාධාවන් නො තකා එම ජනාවාස සංවර්ධනය කිරීමට පහසුකම් සැපයීමේ

සුවිශේෂ අරමුණ ඇතිව නිර්මාණය කරන ලද සාමාජික ප්‍රතිපාදන වැඩසටහන යි. 1996 සිට මහ නගර සභාවට තේරී පත් සාමාජිකයන් 53 දෙනාගෙන් සෑම කෙනෙකුම ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල ජීවන තත්ත්වයන් උසස් කිරීම සඳහාම වැය කිරීමට ස්ථාවර වාර්ෂික මුදලක් වෙන් කර ඇත (Gunetilleke and Abdul Cader, 2004). 2013 දී එක් එක් සාමාජිකයා වෙන් කළ මුදල රු. මිලියන 3ක් වූ අතර මුළු මුදලක් වශයෙන් ගත් විට වාර්ෂිකව රු. මිලියන 159ක් විය. මෙම ජනාවාසවලට මෙකී අරමුදල් වෙන් කිරීම පිළිබඳ තීරණ ගැනීමේ දී නගර සභා සාමාජිකයෝ ඉමහත් නිදහසක් භුක්ති විඳිති. අතීතයේ දී වැඩි ම මුදලක් වැය කර ඇත්තේ ජලාපවහන නළ හා මලාපවහන නළ සංවර්ධනය කිරීමට සහ ඉන්පසුව ජනාවාස මට්ටමේ යටිතල පහසුකම් (මාර්ග/පටු මාර්ගවලට තාර දැමීම, වීදි ආලෝක කිරීම යනාදිය) හා නිවාස වැඩි දියුණු කිරීමට යි. ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීමට සාමාජික ප්‍රතිපාදන මඟින් කොළඹ මහ නගර සභාවට හැකියාව ලැබී ඇතත් ඒ සඳහා යොදා ගෙන ඇති විධික්‍රමයෙන් හැඟෙන්නේ පද්ධතිය බෙහෙවින් දේශපාලනීකරණය වී ඇති බව හා කොළඹ මහ නගර සභාවේ සැලසුම්කරණ හා මෙහෙයුම් හැකියාව හානි වී ඇති බව යි. 1990 ගණන්වල සිට මෙකී ජනාවාසවල ජීවන තත්ත්වයන් ම ඉලක්ක කොට ගෙන ක්‍රියාත්මක වූ වෙනත් වැඩ සටහන් පහත වගුව තුළ ලැයිස්තුගත කර ඇත (Gunetilleke and Abdul Cader, 2004).

**1 වන වගුව: ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල ජීවන තත්ත්වයන් ඉලක්ක කර ගත් වැඩසටහන්**

| වැඩ සටහන | අවධානය | කාල සීමාව | හවුල්කාරිත්වය |
|---|---|---|---|
| පවිත්‍ර ජනාවාස වැඩ සටහන | අඩවි සංවර්ධනය හා දත්ත රැස් කිරීම. | 1994-1998 | නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය (MHUD), ලෝක බැංකුව |
| නාගරික සංවර්ධනය හා නිවාස සම්පාදනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය/ රියල් ඉස්ටේට් එක්ස්චේන්ජ් (පෞද්.) සමාගම (REEL) | ඉහළ ඝනත්වයක් සහිත නිවාස යෝජනා ක්‍රම වෙනත් ස්ථානවලට රැගෙන යාම මඟින් වාණිජ ඉඩම් සංවර්ධනය කිරීම. | 1994- | ශ්‍රී ලංකාවේ රජය (GOSL), කොටස් හිමියන් ලෙස නාගරික ආයතන සිටින පෞද්ගලික සමාගම |

| වැඩ සටහන | අවධානය | කාල සීමාව | හවුල්කාරිත්වය |
|---|---|---|---|
| තිරසාර නගර වැඩසටහන | සන්තක ඉඩම විකුණා වෙනත් ස්ථානයක පදිංචියට යාම | 2000-2001 | එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස මධ්‍යස්ථානය (UNCHS) |
| කොළඹ පිහිටි ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස සහභාගිත්වය පදනම් කර ගෙන වැඩි දියුණු කිරීම (PRIMUSS) | ජලය හා සනීපාරක්ෂාව, ප්‍රජාව ශක්තිමත් කිරීම | 2002-2005 | කොළඹ මහ නගර සභාව (CMC), ජර්මානු තාක්ෂණික සහයෝගිතාව (GTZ), ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශය (BMZ) |
| දරිද්‍රතාව අවම කිරීමේ වැඩ සටහන | ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල ආර්ථික සංවර්ධනය, අඩවිවල වැඩි දියුණුව, ප්‍රජාව ශක්තිමත් කිරීම | 2001-2003 | CMC, UNCHS, ජාත්‍යන්තර සංවර්ධන දෙපාර්තමේන්තුව (DFID) |
| නාගරික මූලික සේවා වැඩ සටහන | ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස තුළ පොදු පහසුකම් සම්පාදනය - කොළඹ දිස්ත්‍රික්කය (නගරය හා මහ කොළඹ) තුළ වැසිකිළි, ජල කරාම, නාන කාමර | 1979-1993 | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF), CMC, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) |
| සුවපත් නගර වැඩ සටහන | නිවැසියන්ගේ දැනුවත්කම නැංවීම | 2001-2004 | ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) |

| වැඩ සටහන | අවධානය | කාල සීමාව | හවුල්කාරිත්වය |
|---|---|---|---|
| ප්‍රාදේශීය තිරසාර සංවර්ධන නිරීක්ෂණාගාරය (LASDO) | දුප්පතුන්ට හිතැති නාගරික සැලසුම්කරණය සඳහා ඩිජිටල් ක්‍රමයට සිතියම් සකස් කිරීම | 2001-2003 | CMC, යුරෝපා සංගමය (EC), පැරිස් හා මැඩ්රිඩ් නගර, ඒෂියා අර්බ්ස් |
| අවධාන නගර ක්‍රියාකාරී පර්යේෂණ ව්‍යාපෘතිය: කොළඹ නගරය | නාගරික මූලික සේවාවන් වෙත වඩා මැනවින් ප්‍රවේශ විය හැකි පරිදි ජනතාවගේ හැකියාව ශක්තිමත් කිරීම, පරිසර දූෂණය හා ස්වාභාවික ආපදාවන්ට ගොදුරු වීමට ඇති ඉඩකඩ අවම කිරීම | 2006-2010 | CMC, දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA), ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය (IDRC), සෙවනත |
| කොළඹ ප්‍රජාව බල ගැන්වීමේ ව්‍යාපෘතිය | ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස තුළ ජීවනෝපායන් හා ජීවන පරිසරය වැඩි දියුණු කිරීම පිණිස කොළඹ මහ නගර සභාව සහ වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග ක්‍රියාකාරීව සම්බන්ධ වීම සඳහා කොළඹ නගරයේ ප්‍රජාවන්ට දැනුම හා නිපුණතාවන් සපයා බල ගැන්වීම | 2011-2015 | CMC, සෙවනත, DFID/UK |
| | | | |

මූලාශ්‍රය: Gunetilleke and Abdul Cader, 2004, & Website of the Colombo Municipal Council (CMC), accessed March 2014. http://www.cmc.lk/index.php?option=com_content&view=archive&Itemid=80

මීට අමතරව රජය සමග එක්ව රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් පෞද්ගලික ආයතන ද නාගරික අංශයේ සුරක්ෂිත පානීය ජල, සනීපාරක්ෂක හා ජලාපවහන ප්‍රවේශය ඇතුළු මැදිහත් වීම්වලට සහාය වීම සඳහා විවිධ දරිද්‍රතා පැතිකඩවලට අදාළ හැකියාවන් හා ක්ෂේත්‍ර විවිධාංගීකරණයට සම්බන්ධ විය. දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, ආසියා පාරිසරික සහයෝගිතා (ECO-Asia) ආයතනයේ සහාය ඇතිව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක එකිනෙකට වෙනස් ජල සේවා සම්පාදන මොඩල පහ පිළිබඳ තුලනාත්මක තක්සේරුවක් (2010) සිදු කළේ ය. අරමුණ වූයේ විවිධ මොඩලවල කාර්ය සාධනය පිළිබඳ දැනුම සම්පාදනය කිරීම සහ නාගරික දුප්පතුන්ට සුදුසු, ඵලදායක හා කාර්යක්ෂම ජල සේවා ව්‍යාපෘති සැලසුම් කිරීම යි. තක්සේරුව සිදු කළේ අදාළත්වය, ඵලදායකත්වය, කාර්යක්ෂමතාව, බලපෑම හා තිරසාර භාවය යන ප්‍රශ්න පහ යොදා ගනිමිනි. එළඹි නිගමන වූයේ ඉහත සඳහන් කළ පැතිකඩවල් සම්බන්ධයෙන් ගත් කල ඒ ඒ මොඩලයේ වාසි හා අවාසි පවතින බව සහ එම මොඩලවලට නාගරික දුප්පත් ප්‍රජාවන්ගේ ජල ප්‍රවේශය වැඩි දියුණු කරන අතර ආදායම් නොලබන ජල අංශය අවම කිරීමේ හැකියාව ඇති බව ය.

දුප්පතුන්ට හිතැති ජල සේවාවන් සැලසුම් කිරීමට හැකියාව ලබා දීම පිණිස නාගරික දුප්පතුන් අතර ජල සේවාවන් සඳහා පවතින ඉල්ලුම අවබෝධ කර ගැනීමට CEPA ආයතනය කළ තවත් අධ්‍යයනයකින් (2009) අනාවරණය වූයේ සාර්ථක ලෙස දුප්පතුන්ට හිතැති ජල සම්බන්ධතා සම්පාදනය කරන බොහෝ වැඩ සටහන් පවතින බවත් දුප්පතුන්ට හිතැති ජල සේවාවන් සම්පාදනය කරන ඕනෑ ම වැඩ සටහනක් කුටුම්බයට ප්‍රමාණවත් ජලාපවහන හා අදාළ තැන්වල දී මලාපවහන සම්බන්ධතා සපයන්නේ කෙසේ ද යන්න ගැනද අවධානය යොමු කළ යුතු බවත් ය.

තවත් ජීවනෝපාය තක්සේරුවක් (UNHABITAT, CEPA et al., 2012) සිදු කෙරුණේ නාගරික කොළඹ තුළ පිහිටි ගංවතුරට ගොදුරු විය හැකි අඩු ආදායම්ලාභී ජනාවාස පිළිබඳව ය. අරමුණ වූයේ ගංවතුරට ගොදුරු විය හැකි ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල ජීවනෝපායන් හා ගොදුරු වීමට ඇති ඉඩකඩ පිළිබඳ අවබෝධය වැඩි දියුණුකිරීම සහ ප්‍රජාවන්ගේ ජීවනෝපාය රටාවන් පදනම් කර ගෙන එම ජනාවාස ශ්‍රේණිගත කිරීමට රාමුවක් සැකසීම යි. එක් ප්‍රයෝජනවත් සොයා ගැනීමක් වූයේ සමීක්ෂණයට ලක් කළ ප්‍රජාවන්ගෙන් සියයට 76 ක් ගංවතුරෙන් පීඩාවට පත් වන බව සහ සමීක්ෂණයට ලක් කළ ප්‍රජාවන් තුළ මලාපවහන සම්බන්ධතා දුර්වල වීම හෝ නොමැතිකම නිසා වැසි සමයේ දී වැසිකිළි පිටාර ගලන බව ය.

## 4. නාගරික දරිද්‍රතාවට විසඳුම් සෙවීමේ දී මුහුණ දෙන අභියෝග

නාගරික දරිද්‍රතාව ඉලක්ක කළ මැදිහත් වීම් අවශ්‍ය කරන සුවිශේෂ විෂය ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගැනීමත් සමග එය මුහුණ දෙන අභියෝග ප්‍රධාන මූලාශ්‍ර තුනකින් පැන නගින බව දැකිය හැකි ය;

i. ආයතනික තත්වයේ සංකීර්ණතා,
ii. ප්‍රතිපත්තිමය රාමුව තුළ පවතින දුර්වලතා,
iii. දරිද්‍රතාව හා එහි බලපෑම් පිළිබඳ දැනුමේ සීමිතකම.

## 4.1 ආයතනිකතත්වය

ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස සංවර්ධනය කිරීමෙන් නාගරික දුප්පතුන්ගේ ජීවන තත්වයන් වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියට නියාමන රාමුව, සේවා සම්පාදනය සහ යටිතල පහසුකම් හා පහසුකම් සම්පාදනය සම්බන්ධ වගකීම් දරන නාගරික හා ජාතික ආයතන ගණනාවක් සම්බන්ධ ය. නගරය තුළ දීර්ඝතම ඉතිහාසය ඇති කොළඹ මහ නගර සභාව කොළඹ පාලනය කරන ආයතනය ද මූලික නියාමන හා සේවා සම්පාදන ආයතනය ද වේ. එහෙයින් එය නගරය තුළ සැලසුම්කරණ හා ක්‍රියාත්මීකරණ කාර්යයන් ගණනාවක් ම ඉටු කරන්නේ ය.

කෙසේ වුව ද සුවිශේෂ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා 1970 ගණන්වල අග සමයේ සිට ආයතන ගණනාවක් පිහිටුවා ඇත. නාගරික සංවර්ධන අධිකාරිය (UDA) පිහිටුවන ලද්දේ කොළඹ ඇතුළු ශ්‍රී ලංකාවේ සියලු නාගරික ප්‍රදේශ තුළ ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සැලසුම්කරණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ය. පොදු පහසුකම් මණ්ඩලය (CAB) පිහිටුවන ලද්දේ කොළඹ අඩු ආදායම්ලාභී ජනාවාස තුළ සේවාවන් ඉදි කර නඩත්තු කිරීම සඳහා ය. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) නිවාස ණය සම්පාදනය කරන අතර අධිකාරිය විසින් මිල දී ගත් ඉඩම්වල නිවාස අයිතිය නියාමනය කරයි. ලංකා විදුබල මණ්ඩලය (CEB) සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWSDB) වැනි ජාතික පරිමාණ සේවා සම්පාදකයෝ ද ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස තුළ ක්‍රියාත්මක වෙති. 1980 ගණන්වල දී ප්‍රජා සංවර්ධන මණ්ඩල (CDC) පිහිටුවූයේ කොළඹ මහ නගර සභාවේ හා වෙනත් ආයතනවල සහයෝගය ඇතිව ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිණිස ව්‍යාපෘති තීරණ ගැනීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම්වල දී සම්බන්ධ වීමට ප්‍රජාවන් සංවිධානය කිරීම හා සජීවීකරණය කිරීම සඳහා ය. ප්‍රජා සංවර්ධන මණ්ඩලවල අවධානය ප්‍රධාන වශයෙන් යොමු වූයේ නිවාස වැඩි දියුණු කිරීම සහ සේවාවන් හා යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි ය. එවක පැවති නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය යටතේ 2008 දී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය (USDA) පිහිටුවන ලද්දේ නාගරික ජනාවාස සංවර්ධනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ සහ එම ප්‍රතිපත්ති ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල පුද්ගලයන්ගේ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කරමින් ක්‍රියාත්මක කෙරෙන බව සහතික කිරීමේ අරමුණ ඇතිව ය. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය දැන් ක්‍රියාත්මක වන්නේ ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ ය. රාජ්‍ය ආරක්ෂක හා නාගරික

සංවර්ධන අමාත්‍යාංශය ද ගංවතුර පාලනය කිරීමේ හා මාර්ග වැඩි දියුණු කිරීමේ හැරුණු විට ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීමේ සහ කොළඹ නගරය අලංකාර කිරීමේ නිරතව සිටී. නාගරික සංවර්ධන අධිකාරිය ද කොළඹ නගරයේ පිහිටි ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල ජීවත් වන පැල්පත්වාසීන් නැවත පදිංචි කිරීම සඳහා නිවාස ඉදි කිරීමේ නියැලී සිටී.

අංශය තුළ ප්‍රධාන ක්‍රියාකාරකයන් වන්නේ ඉහත සඳහන් කළ ආයතන වන අතර විශේෂ කාර්යයන් හා නියාමන විධිනියෝග සහිත වෙනත් ආයතන ගණනාවක් ද පවතී. විවිධ ආයතනවල විධිනියෝග හා වගකීම් යම්තාක් දුරකට සමාන වීමෙන් ඇති වන අකාර්යක්ෂමතා ද ඇත. ආයතනවල විධිනියෝග අසමාන වන විට මෙම තත්ත්වය තවත් උග්‍ර වේ. උදාහරණයක් ලෙස නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියේ දී මෙන් නො ව ජනාවාසවලට සේවාවන් සම්පාදනය කළ විට ඒවා ස්වයංක්‍රියව වැඩි දියුණු වී වැඩි ස්ථාවරත්වයක් හා හිමිකම පිළිබඳ හැඟීමක් ඇති වේ. මේ නිසා කුටුම්බවලට ස්ථිර ජල ප්‍රවේශයක් සැපයීමෙන් ආදායමක් නොලබන ජලය, ආදායමක් ලබන ජලය බවට පරිවර්තනය කිරීමේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වැඩ සටහන නැවත පදිංචි කිරීමේ ප්‍රයත්නයන් සමග ඍජුව ම ගැටෙයි. නාගරික දරිද්‍රතාවට යොමු කරන අවධානය වැඩි වීම හේතුවෙන් ආයතනවල නැඹුරුව වෙනස් වෙමින් පවතින නිසා මෙම තත්ත්වය තවත් නරක අතට හැරේ. නැඹුරුවෙහි සිදු වන එවැනි වෙනස් වීම්වලට ගැළපෙන පරිදි මෙම ආයතනවල නීතිමය තත්ත්වය කඩිනමින් වෙනස් නොවීම හේතුවෙන් මෙය තවත් සංකීර්ණ වේ. මේ නිසා කොළඹ මහ නගර සභාව වැනි ආයතනවලින් ක්‍රියාත්මක කෙරෙන දුප්පතුන්ට හිතැති ක්‍රියාකාරකම්වලින් බොහොමයක් එහි දැඩි නීතිමය විධිනියෝගයෙහි ඇතුළත් වන ඒවා නො වේ. රාජ්‍ය ආයතන බොහෝ අවස්ථාවල දී මෙම බාධාවන් ජය ගන්නේ නාගරික දරිද්‍රතාව තුරන් කිරීමේ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම සහිත වූත් එම ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන්නා වූත් රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණයෙහි යෙදීමෙනි.

අලංකරණ ක්‍රියාවලියේ දී කොළඹ නගරයට අයත් මූලික ඉඩම්වල පිහිටි සමහර විනෝදායන උද්‍යාන පවරන විට හිමිකම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය හා කොළඹ මහ නගර සභාව අතර තරමක ආතතියක් පවතී (Sunday Times, 2011). කොළඹ නගරය තුළ සිදු වන මෙම නව සංවර්ධන ක්‍රියාවලියෙන් ප්‍රතිලාභ සැලසෙන්නේ ජනගහනයේ කුඩා කොටසකට බැවින් එය සමබරතාවෙන් තොර බවට ද මතයක් පවතී. එපමණක් නො ව දැන් සිදු වෙමින් පවතින අවතැන් වීම් හා නැවත පදිංචි කිරීම් පිළිබඳව සිදු විය යුතු මහජන සාකච්ඡාව හා සුපරීක්ෂාව නොමැතිකම ද ඔවුන්ගේ යහපැවැත්ම කෙරෙහි බලපායි (CEPA, 2013).

## 4.2 ප්‍රතිපත්තිමය රාමුව

ආයතනික හා නීතිමය රාමුවට අදාළව මුහුණ දෙන ගැටලුවලින් පිළිබඹු වන්නේ ශ්‍රී ලංකාව තුළ නාගරික දරිද්‍රතාව පිළිබඳ ගැටලුවලට විසඳුම් සොයන ප්‍රතිපත්තිමය රාමුවේ ඇති දුර්වලතාවන්ය. කොළඹ නගරයේ සංවර්ධනය සැලසුම් කිරීම සඳහා දැරූ සෑම ප්‍රයත්නයක දී ම නගරය සලකා ඇත්තේ තනි ඒකකයක් ලෙස වන අතර මැදිහත් වීම ප්‍රධාන වශයෙන් සිදු වූයේ අවකාශය සැලසුම් කිරීම, පුළුල් වන නගරය සඳහා සේවාවන් හා යටිතල පහසුකම් ක්‍රමානුකූල කිරීම සහ නගරයේ ආර්ථික වර්ධනය සඳහා පහසුකම් සැලසීම සම්බන්ධයෙනි. මෙම නැඹුරුව 1978 කොළඹ ප්‍රධාන සැලැස්ම, 1985 කොළඹ නගර සංවර්ධන සැලැස්ම, 1996 කොළඹ නගර ප්‍රදේශයේ ව්‍යුහාත්මක සැලැස්ම, 2000 මහ නගර සභා සැලැස්ම තුළමෙන් ම 2011-2030 ජාතික භෞතික සැලැස්ම තුළ ද පිළිබිඹු වේ. නාගරික දරිද්‍රතාව පිළිබඳ දෘෂ්ටි කෝණයෙන් සලකා බලන කල මෙම සැලසුම්වල පවත්නා සැලකිය යුතු අඩුපාඩුවක් වන්නේ නාගරික දරිද්‍රතාවේ සංකීර්ණතාවන් පිළිගැනීම කරා ක්‍රමයෙන් යොමු වන තත්ත්වයක් තිබිය දීත් නිම්න ප්‍රදේශවල නිවාස සම්පාදනය සහ ගංවතුර හා ජලාපවහන කළමනාකරණය දිගින් දිගට ම විශේෂ ඉලක්කයක් ලෙස සැලකීම යි.

වඩා මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ නාගරික දැක්ම ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් බවට පරිවර්තනය කිරීම සඳහා නාගරික ප්‍රතිපත්තියක් හඳුන්වා දෙනු ලැබිණ. මෙම ප්‍රතිපත්තිමය ලියවිල්ලට අනුව ශ්‍රී ලංකාවේ නාගරික දැක්ම වන්නේ "2020 වන විට නගර කලාප පහක් තුළ ඒකරාශි වූ තරගකාරී, පාරිසරිකව තිරසාර, මැනවින් අන්තර් සම්බන්ධිත නගර පද්ධතියක් ඇති කිරීම සහ සෑම පවුලකට ම මිල දී ගත හැකි, ප්‍රමාණවත් වාසස්ථානයක් සම්පාදනය කිරීම" යි. ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා පහත දැක්වෙන සහායක පියවරයන් හතර පදනම් කර ගත් ක්‍රමෝපායක් අවශ්‍ය බව ද ලියවිල්ල අවධාරණය කරයිඃ

- ක්‍රමෝපායාත්මක හා ඒකාබද්ධ ජාතික, ප්‍රාදේශීය, නාගරික සැලසුම්කරණයක් වෙත යොමු වීම.
- තිරසර අරමුදල් සම්පාදනය සහ ප්‍රාදේශීය හා නාගරික සැලසුම්කරණයේ වැඩි දියුණුව සහතික කිරීම.
- කාර්ය සාධනය පදනම් කර ගත් නගර කළමනාකරණයකට හා අරමුදල් සම්පාදනයකට අවශ්‍ය මෙවලම් සකසා නාගරික පළාත් පාලන ආයතන (ULAs) වග වීම් සහගත සේවා සම්පාදකයන් ලෙස නැවත තහවුරු කිරීම.
- ජීවත් වීමට සුදුසු දියුණු නගරයක් උදෙසා කාර්යක්ෂම හා තිරසාර වූ ඉඩම් හා නිවාස සංවර්ධනයකට අනුබල දීම.

## 4.3 නාගරික දරිද්‍රතාව පිළිබඳ දැනුම් පදනම පුළුල් කිරීම දෙසට යොමු වීම

ශ්‍රී ලංකාව තුළදරිද්‍රතාව සම්බන්ධ දැනුම ගොඩනැඟීම්, ප්‍රතිපත්ති සම්පාදන හා විවේචනාත්මක ඇගයීම් කටයුතුවල ප්‍රධාන අවධානය යොමු වී ඇත්තේ ග්‍රාමීය ආර්ථිකයන් හා සමාජයන් කෙරෙහි ය. ශ්‍රී ලංකාවේ නාගරික දුප්පතුන්ට ජාතික - එනම් ග්‍රාමීය - ප්‍රමිතීන්ට සැලකිය යුතු ලෙස වෙනස් දරිද්‍රතා බලවේගවලට හා පැතිකඩවලට මුහුණ දෙන විශේෂ කණ්ඩායමක් ලෙස පිළිගැනීමක් ලැබී ඇත්තේ සුළු වශයෙනි.

1990 ගණන් වන තෙක් නාගරික දුප්පතුන් සම්බන්ධ දැනුම හිඟකම ද රාජ්‍යය සිය දරිද්‍රතා මැදිහත් වීම් කුටුම්බ පරිභෝජනය හා නිවාසකරණය කෙරෙහි බලපෑමක් කිරීමට උත්සාහ කළ ඉතා සරල හා මූලික මැදිහත් වීම්වලට පමණක් සීමා කිරීම ද අතර පැවතියේ චක්‍රීය සම්බන්ධතාවකි. කෙසේ වුව ද නාගරික දරිද්‍රතාව රාජ්‍ය හා වෙනත් ආයතනවල අවධානය වැඩි වැඩියෙන් දිනා ගනිත් ම, අදාළ ගැටලු හා යොදා ගත හැකි විසඳුම් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිකම පවත්නා සම්පත් ප්‍රශස්ත ලෙස ප්‍රයෝජනයට ගැනීමට හා සතුටුදායක ප්‍රතිඵල සහතික කිරීමට සැලකිය යුතු බාධාවක් බවට පත් විය. අනුක්‍රමයෙන් මෙම විෂය පිළිබඳව වැඩි වැඩියෙන් අධ්‍යයනයන් සිදු වෙමින්, දත්ත පදනම් වර්ධනය කෙරෙමින් පවතින නමුත්[8] තීරණ ගන්නා හා වැඩ සටහන් සැලසුම් කරන ක්‍රමෝපායාත්මක හා සැලසුම්කරණ මට්ටම්වල දී ඒවාට ආධාරයක් වශයෙන් පවතින්නේ ඉතා සුළු දැනුමක් යැයි දැඩි හැඟීමක් ඇති බව පෙනේ. මෑතක එනම් 2011 දී නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාව තුළ පවත්නා ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස සියල්ල ම පිළිබඳව සමීක්ෂණයක් සිදු කර ඇත. 2012 දී සෙවනත ආයතනය කොළඹ මහ නගර සභාවේ හවුල්කාරිත්වය ඇතිව කොළඹ දරිද්‍රතා පැතිකඩ වාර්තාව යාවත්කාල කළ අතර තවදුරටත් වැඩි දියුණු කිරීම් අවශ්‍ය කරන ප්‍රමුඛතා ජනාවාස හඳුනා ගැනීමට කොළඹ පිහිටි සියලු අඩු ආදායම්ලාභී ජනාවාස පිළිබඳව සමීක්ෂණයක් හා තක්සේරුවක් ද සිදු කළේ ය.

## 5. ක්ෂණිකව මැදිහත් විය හැකි ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනීම

කොළඹ දී දුප්පතුන්ට හිතැතිව කෙරෙන මැදිහත් වීම් බොහෝ බාධාවන්ට මුහුණ දෙන නමුත් සාර්ථක විය හැකි මැදිහත් වීම්වලට ඉතා ශක්තිමත් පදනමක් සම්පාදනය කරන සාධක කිහිපයක් පවතින්නේ ය;

- කොළඹ පිහිටි ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවලින් බොහොමයක් ප්‍රමාණයෙන් ඉතා කුඩා ඒවා වේ. ජනාවාසවලින් 74% ක ඇත්තේ නිවාස ඒකක 50 කට වඩා අඩුවෙන් වන අතර නිවාස ඒකක 500 කට වඩා ඇත්තේ 0.7%ක පමණකි. මෙය උපරිම

[8] උදාහරණ: 1) පවිත්‍ර ජනාවාස වැඩ සටහන යටතේ සිදු කළ ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස පිළිබඳ සිද්ධි අධ්‍යයන, 2)කොළඹ නගරය පිළිබඳ දත්ත පදනම හා දරිද්‍රතා පැතිකඩ; ප්‍රජාව බල ගැන්වීම මගින් නාගරික දරිද්‍රතාව අවම කිරීම, 2002.

ප්‍රජා සහභාගිත්වයකින් හා අවම ගැටුමකින් යුතුව සේවාවන් වර්ධනය කිරීමට බාහිර ආයතනවලට ඉඩ සලසයි.

- ජනාවාසවල ජනගහනය බොහෝ විට තුන් වන හෝ හතර වන පරම්පරාවට අයත් නිවැසියන් නිසා ජනාවාස තුළට අලුතින් සංක්‍රමණය වීමක් සිදු වන්නේ ඉතා අඩුවෙනි. පැල්පත් දිගින් දිගට ම පුළුල් වීම වැනි අලුතින් සංක්‍රමණය වීම් නිසා මුහුණ දෙන ගැටලුවලට කොළඹ දී මුහුණ දීමට සිදු නො වේ.
- නිවැසියන්ගේ පරිශ්‍රමයන් හා බාහිර මැදිහත් වීම් කරණ කොට ගෙන පසු ගිය දශක තුනේ දී ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල ජීවන තත්ත්වයන්හි වේගවත් වැඩි දියුණු වීම් සිදු වී ඇත.

මේ අනුව ආයතනවලට හා සාර්ව සැලසුම්කරණයට බලපාන ප්‍රතිපත්තිමය හා නීතිමය ගැටලුවලට විසඳුම් සෙවීම දුෂ්කර නමුත් සැලකිය යුතු බලපෑමක් සහිත විසඳුම් සෙවිය හැකි සුවිශේෂ ක්ෂේත්‍ර පවතී. ඒවා මෙසේ ය;

- **ප්‍රජා මූල ආයතන ශක්තිමත් කිරීම**: රාජ්‍ය හා රාජ්‍ය නොවන නියෝජිතයන් සමග සහයෝගයෙන් ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාසවල ජීවන තත්ත්වයන් තිරසාරව හා අදාළව වැඩි දියුණු කිරීමට පහසුකම් සැපයිය හැකි හොඳ ම තත්ත්වයේ සිටින්නේ ප්‍රජා සංවර්ධන මණ්ඩල (CDC) ය. කෙසේ වුව ද ඒවායේ සංවිධානීය හැකියාවන්, නායකත්වය හා සාකච්ඡාමය නිපුණතා ශක්තිමත් කිරීමේ ද කණ්ඩායම් ගොඩ නැගීමේද නිවැසියන්ගේ හිමිකම වැඩි දියුණු කිරීමේද අවශ්‍යතාවක් පවතී. ව්‍යාපෘති ගණනාවක් 'සජීවීකරණ' හා 'බල ගැන්වීම්' මැදිහත් වීම් සිදු කර සැලකිය යුතු සාර්ථකත්වයක් නො ලබා ඇති බැවින් මෙය පහසු කටයුත්තක් නොවන බව පිළිගත යුතු ය. කෙසේ වුව ද නිරීක්ෂණය කළ හැකි ක්‍රමික වෙනසක් සිදුව තිබෙන අතර ප්‍රජා සංවර්ධන මණ්ඩල ප්‍රමාණවත් සේවාවන් හෝ පහසුකම් නොමැති ජනාවාස තුළ දී කොළඹ මහ නගර සභාව හා වෙනත් ආයතන සිය කටයුතුවලට උපයෝගී කරන ගන්නා මණ්ඩලයක් ලෙස නො ව රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල හවුල්කරුවන් ලෙස හඳුනා ගත හොත් එම වෙනස තව දුරටත් වර්ධනය කළ හැකි ය. මේ සඳහා වර්තමානයේ ප්‍රජා සංවර්ධන මණ්ඩල පාලනය වන නියාමන රාමුව පුළුල් කිරීම ද අවශ්‍ය විය හැකි ය.
- **යෞවන හා ළමා ගැටලු**: මෙය වහා අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයකි. අස්ථාවර සමාජ වියමන විශේෂයෙන් ම ළමා හිතකාමී නොවන සමාජීය හා භෞතික වාතාවරණ තුළ හැදී වැඩීමට බල කෙරී ඇති ළමයින් උදෙසා නිර්මාණය කරන්නේ අහිතකර පරිසරයකි. වඩා පුළුල් අධ්‍යාපනික අවස්ථා සලසමින්, ජීවන නිපුණතා හා සුරක්ෂිතතාව වැඩි දියුණු කරමින් පවුල් ඒකකය ශක්තිමත් කරන, පොදු ස්ථාන, පෙර පාසල්, දිවා සුරැකුම් යනාදිය වැඩි කරන ක්‍රියාකාරකම් වලට මුලපිරිය යුතු ය.

- **සේවාවන් පරිහරණය:** පවත්නා සේවාවන් හා පහසුකම් (ඝන අපද්‍රව්‍ය, වැසිකිළි යනාදිය) ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ පුරවැසි දැනුවත්කම/පොදු අධ්‍යාපනය වැඩි දියුණු කළ යුතු ය.
- **නිපුණතා සංවර්ධනය:** ස්ථාවර රැකියාවක් සහ/හෝ වඩා ඉහළ වැටුප් ලැබෙන වැටුප් ශ්‍රමය/ස්වයං රැකියා වෙත ප්‍රවේශය සලසා ගැනීම පිළිබඳ නිපුණතා වැඩි දියුණු කළ යුතු ය.

## විමර්ශන / වැඩි දුර කියවීම්

CIA World Fact Book (2012), Sri Lanka Fact Book, Available online http://www.indexmundi.com/sri_lanka/

CEPA, 2009. *Survey on Willingness and Ability to Pay for Pro-Poor Household Water Connections,* Report submitted to Environmental Cooperation-Asia (Eco Asia) and USAID, Colombo: Centre for Poverty Analysis. Print.

CEPA, 2010. *Analysis of Pro-Poor Service Models for Urban Areas in Sri Lanka,* Final Report Submitted to Environmental Cooperation-Asia (Eco Asia), USAID, Centre for Poverty Analysis, Colombo

Collective for Economic Democratisation, 2014. "Towards a World-Class Colombo: Development without Democracy" in Gunasekara, V. & Alles, R. *You may say I'm a dreamer: Essays on reimagining development.* Colombo: Centre for Poverty Analysis. Chapter 3, pp 9-11. Print. Also published in *The Island* 16/06/2013. Available online at http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=81464

Chularatne, H. M. U., 2000. *Land Tenure Issues and Improvement of Urban Low Income Settlements: Experiences of Colombo, Sri Lanka,* a paper presented at the Regional Workshop on Settlements of the Urban Poor: Challenges in the New Millennium, Colombo.

DFID/UNDP/UN-HABITAT/UMP, 2002. *Poverty Profile, City of Colombo: Urban Poverty Reduction through Community Empowerment,* Urban Poverty Reduction Project, Colombo:Sevanatha.

DCS, 2004. *Official Poverty Line for Sri Lanka,* Colombo: Department of Census and Statistics, Print

DCS, 2011. *Household Income and Expenditure Survey 2009/2010,* Colombo: Department of Census and Statistics. Print.

Gunetilleke, N., 2004. *Understanding the Dimensions and Dynamics of Poverty in Underserved Settlements in Colombo,* Working Paper No. 3. Colombo: Centre for Poverty Analysis/ Participatory Improvement of Underserved Settlements in Colombo (PRIMUSS)

Gunatilleke, N. & Abdul Cader, A., 2004 Urban Poverty in Sri Lanka, Poverty Brief 7, Colombo: Centre for Poverty Analysis. Print

Romeshun, K. & Mayadunne, G., 2011. *Appropriateness of the Sri Lanka poverty line for measuring urban poverty: the Case of Colombo.* Human Settlements Working Paper No. 35, London: International Institute for Environment and Development. Print.

Ministry of Urban Development and Sacred Area Development, 2009. *Urban*

*Development,* Available online available at http://www.urbanmin.gov.lk.

Sevanatha, 2012. *Colombo Community Empowerment Project: Low Income Settlement Survey-2012,* Unpublished Data.

Fazlulhaq, N., 2011. *I'm not against beautification of Colombo, but it must be for all not some: Muzammil,* Article published in *The Sunday Times,* 23/10/2011, Available online at : http://www.sundaytimes.lk/111023/News/nws_31.html

The International Bank for Reconstruction and Development, World Bank, 2012. *Turning Sri Lanka's Urban Vision into Policy and Action,* Colombo: World Bank. Available online at: http://www.unhabitat.lk/downloads/wburbanpolicy.pdf

UN-HABITAT, CEPA & Sevanatha. 2012. "Livelihood Assessment of Flood-Prone Low-Income Settlements in the City of Colombo." Report prepared for the World Bank, Colombo.

සංක්ෂිප්ත ප්‍රකාශන මාලාව

දරිද්‍රතා සංක්ෂිප්ත

No. 1 Overview of Poverty in Sri Lanka
No. 2 Livelihoods and Poverty in Sri Lanka
No. 3 Poverty Reduction Strategy in Sri Lanka
No. 4 Dimensions of Conflict Outside the North and East of Sri Lanka
No. 5 Poverty and Youth Issues in Sri Lanka
No. 6 Poverty Issues in Southern Sri Lanka
No. 7 Urban Poverty in Sri Lanka
No. 8 Gender Dimensions of Poverty in Sri Lanka
No. 9 The Role of International Financial Institutions in Sri Lanka
No. 10 Poverty and Trade Issues in Sri Lanka
No. 11 ශ්‍රී ලංකාවේ ළමා දරිද්‍රතාවය
No. 12 දරිද්‍රතාව සහ වියපත්භාවයේ අභියෝග
No. 13 ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ විශ්ලේෂණය - 2013
No. 14 ශ්‍රී ලංකාවේ නාගරික දරිද්‍රතාව - 2013

cepa
centre for poverty analysis
Centre for Poverty Analysis
29 R G Senanayake Mawatha, Colombo 7, Sri Lanka
Tel: +94(011) 4690200, 2676955
Fax: +94(011) 2676959
Email: info@cepa.lk
Web: www.cepa.lk

ThinkTank Initiative
Initiative Thinktank

ISBN 978-955-1040-80-2